| අබාන්ස් පුද්' සමාගම | 327,995 | | | 327,995 | 327,995 |
| මෙගා හිටර්ස් | 53,395 | | | 53,395 | |
| ඔපන් සිස්ටම් පුද්' සමාගම | 108,885 | | | 108,885 | |
| සයින් ටෙක් ඇඩ්වර්ටයිසින් | 49,237 | | | 49,237 | |
| එන්.පී.පි ඉංජිනියරින් | 84,930 | | | 84,930 | |
| පුසාන්ස් කන්ස්ට්‍රක්ෂන් | 190,089 | | | 190,089 | |
| ඇල්කොබෙක්ස් පුද්' සමාගම | 89,250 | | | 89,250 | |
| ඉලෙක්ට්‍රොසරව් | 45,103 | | | 45,103 | |
| එ.පි අයි මැෂිනරි | 5,376,000 | | | 5,376,000 | |
| ව්.කේ.කන්ස්ට්‍රක්ෂන් | 2,669,262 | | | 2,669,262 | |
| වෝට¾මන් ඉංජිනියරින් ^hmq\$& i ud u | 5,000,000 | | | 5,000,000 | |
| නෙට් ඉංජිනියරින් | 380,370 | | | 380,370 | |
| ඩැක්සස් ඉංජිනියරින් | 97,457 | | | 97,457 | |
| නිකිණි ඔටෝමේෂන් පුද්' සමාගම | 1,468,544 | | | 1,468,544 | 1,305,671 |
| යුනයිටä ට්‍රැක්ට¾ස් පුද්' සමාගම | 546,460 | | | 546,460 | 30,700 |
| ජෝන් කිල්ස් කාර්‍යාලය | 33,157 | | | 33,157 | |
| ස්Üä වලොප්මන්Ü ඇන්ä කන්ස්ට්‍රක්ෂන් පුද්' සමාගම | 5,427,605 | | | 5,427,605 | 1,894,765 |
| එච්.එම්.එන්ටර්ප්‍රයිසස් | 12,160 | | | 12,160 | |
| මැක්රෝ ඔටෝ ටෙක් පුද්' සමාගම | | | | - | 87,000 |
| **එකතුව** | 26,464,590 | - | - | **26,464,590** | **5,992,461** |

සටහන 28

| ගෙවිය යුතු ගිණුම් | | | | 2013 | 2012 |
| --- | --- | --- | --- | --- | --- |
| | ලංජකාඅආ<br>රු. | බොරැල්ල<br>රු. | අර්ධකාලීන<br>රු. | එකතුව<br>රු. | එකතුව<br>රු. |
| | | | | | |
| **එකතුව** | | | | | |

සටහන 29

| තොග | | | | 2013 | 2012 |
| --- | --- | --- | --- | --- | --- |
| | ලංජකාඅආ<br>රු. | බොරැල්ල<br>රු. | අර්ධකාලීන<br>රු. | එකතුව<br>රු. | එකතුව<br>රු. |
| ලිපි ද්‍රව්‍ය | | | | | |
| තීන්ත | | 435,000 | | 435,000 | 485,000 |
| **එකතුව** | | 435,000 | | **435,000** | **485,000** |

සටහන 30

| ස්ථාවර වත්කම් සඳහා අත්තිකාරම් | | | | 2013 | 2012 |
| --- | --- | --- | --- | --- | --- |
| | ලංජකාඅආ<br>රු. | බොරැල්ල<br>රු. | අර්ධකාලීන<br>රු. | එකතුව<br>රු. | එකතුව<br>රු. |
| ඒ පී අයි මැෂිනරී පුද්' සමාගම | | | | | 5,419,500 |
| ස්වීඩිෂ් ට්‍රේඩින් | | | | | 1,559,100 |
| අබාන්ස් පුද්' සමාගම | 399,319 | | | 399,319 | 399,319 |
| **එකතුව** | | | | **399,319** | **7,377,919** |

සටහන 31

| චලනය නොවන තොග විකුනුම් | | | | 2013 | 2012 |
| --- | --- | --- | --- | --- | --- |
| | ලංජකාඅආ<br>රු. | බොරැල්ල<br>රු. | අර්ධකාලීන<br>රු. | එකතුව<br>රු. | එකතුව<br>රු. |
| විකුණුම් වටිනාකම | | | | | |
| පොත් වටිනාකම | | | | | |
| **එකතුව** | | | | | |

සටහන 32

| පෙර වර්ෂ ගැලපුම් | | | | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| | ලංජකාඅආ<br>රු. | බොරැල්ල<br>රු. | අර්ධකාලීන<br>රු. | එකතුව<br>රු. | එකතුව<br>රු. |
| දේශීය ආදායñ ගිණුම | | | | | (1,080,661) |
| පාඨමාලා ගාස්ත+NVQ | | | | | 11,400 |
| **එකතුව** | | | | | **(1,069,261)** |

සටහන 33

| ධාරිතා සංවර්ධන - ප්‍රාග්ධන වියදම් | | | | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| | ලංජකාඅආ<br>රු. | බොරැල්ල<br>රු. | අර්ධකාලීන<br>රු. | එකතුව<br>රු. | එකතුව<br>රු. |
| පුහුණු හා සංවිරධන- සිංගප්පුරු පුහුණු | 667,861 | | | 667,861 | - |
| පුහුණු හා සංවිරධන ගිණුමට මාරුකිරීම | (667,861) | | | (667,861) | |
| **එකතුව** | - | - | - | - | - |

සටහන 34

| විවිධ ආදායම - කෙටිකාලින | | | | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| | ලංජකාඅආ<br>රු. | බොරැල්ල<br>රු. | අර්ධකාලීන<br>රු. | එකතුව<br>රු. | එකතුව<br>රු. |
| විභාග ගාස්ත+ | | | 70,600 | 70,600 | - |
| අනෙකුත් ආදායම් | | | 24,224 | 24,224 | 86,897 |
| **එකතුව** | - | - | 94,824 | 94,824 | 86,897 |

සටහන 35

| ඩිප්ලෝමා පාඩමාලා ආදායම (එන්.වි.කිව්) | | | | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| | ලංජකාඅආ<br>රු. | බොරැල්ල<br>රු. | අර්ධකාලීන<br>රු. | එකතුව<br>රු. | එකතුව<br>රු. |
| පාඩමාලා ගාස්ත+ | | | 1,080,000 | 1,080,000 | |
| ලියාපදිංචි ගාස්ත+ | | | 98,900 | 98,900 | 138,600 |
| **එකතුව** | - | - | 1,178,900 | 1,178,900 | |

**සටහන 36**

| **ඩිප්ලෝපා පාඨමාලා වියදම් (එන්.වි.කිච්)** | | | | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| | ලංජකාඅආ<br>රු. | බොරැල්ල<br>රු. | අර්ධකාලීන<br>රු. | එකතුව<br>රු. | එකතුව<br>රු. |
| බාහිර කථිකාචාර්ය | | | 333,000 | 333,000 | 98,000 |
| අනෙකුත කාර්යමණ්ඩල දිමනා | | | 86,930 | 86,930 | 40,600 |
| අනෙකුත් වියදම් | | | 47,566 | 47,566 | |
| **එකතුව** | - | - | **467,496** | **467,496** | **138,600** |

## 1. පොදු ප්‍රතිපත්ති

### 1.1 පිළියෙල කිරීමේ පදනම

ගිණුම් ප්‍රතිපත්ති ඇතුළු 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය හිමිකම්, වෙනස්වීම්, මුදල් ප්‍රවාහය සහ ලං.ජ.කා.අ.ආ. යේ සටහන් ශ්‍රීලංකා ගණකාධිකරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇත.

### 1.2 විදේශ විනිමය ගනුදෙනු

සියළුම විදේශ විනිමය අදාලවන ගනුදෙනු එම ගනුදෙනුව සිදුවූ අවස්ථාවේ පවත්නා විනිමය අනුපාතිකය අනුව ශ්‍රීලංකා රුපියල් වලට පරිවර්තනය කොට මෙම මූල්‍ය ප්‍රකාශ වල දක්වා ඇත.

### 1.3 ශේෂ පත්‍ර, දිනෙන් පසුව සිදුවූ සිදුවීම්

සියළුම ප්‍රමාණාත්මක ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවූ සිදුවීම් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගන්නා ලදී.

## 2. වත්කම් හා ඒවා අගය කිරීමේ පදනම

**2.1** ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය (ලං.ජ.කා.අ.ආ.) ලං.ග.ම. මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ පුහුණු ආයතනයක් ලෙස පවත්වා ගෙන ගිය අතර එය 2004 අප්‍රේල් විසි අට දින සිට බලපැවැත්වෙන පරිදි නිපුණතා සංවර්ධන, වෘත්තීය හා කාර්මික අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පරිවර්තනය කරන ලදී. (විශේෂ ගැසට් නිවේදනයක් පරිදි) ලං.ජ.කා.අ.ආ. ට අයත්ව තිබූ වාහන ඇතුලත් වත්කම් පාලක සභාවේ උපදෙස් වලට අනුව අගය කරන ලදී. තවද තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉඩම් හා ගොඩනැගිලි 31.12.2012 දිනට අගය කරන ලදි.

**2.2** ස්ථාවර වත්කම් මිළදී ගන්නා මාසයේ සිට ක්ෂය ප්‍රතිපාදනය කෙරේ. පහත සඳහන් අනුපාත අනුව දේපල,පිරියත සහ උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

| | වර්ෂයකට |
|---|---|
| ගොඩනැගිලි | 10% |
| මෝටර් රථ වාහන | 25% |
| යන්ත්‍ර | 12.5% |
| ලීබඩු හා සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 25% |
| අනෙකුත් උපකරණ | 25% |

**2.3** ශේෂ පත්‍රයේ දැක්වෙන වත්කම් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී හෝ ශේෂ පත්‍ර දිනෙන් වර්ෂයක් ඇතුලත යන දෙකෙන් පළමුව එළඹෙන දිනට මුදලින් උපලබ්ධි වේ යැයි අපේක්ෂා කරන වත්කම් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

## 3. වගකීම් හා ප්‍රතිපාදන

**3.1** මූල්‍යප්‍රකාශපිළියෙල කිරීමේදී දන්නා සියළුම වගකීම් ගිණුම්ගත කර ඇති අතර පවතියැයි දන්නා සියළුමවගකීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසන ලදී.

### 3.2 විශ්‍රාම පාරිතෝෂික

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව, සම්පූර්ණයෙන් ගෙවීමට උද්ගත වී ඇති විශ්‍රාමපාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශ වල ප්‍රතිපාදන සලසන ලදී. විශ්‍රාම පාරිතෝෂිකවල පිරිවැය වන්නේ ලං.ජ.කා.අ.ආ. වසර 05 කට වඩා වැඩි අඛණ්ඩ සේවාවක් ඇති සියළුම සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂිකයයි.

### 3.3 විලම්භීත ආදයම්

මහා භාණ්ඩාගාර අරමුදල් වලින් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදන විලම්භීත ලෙස සලකන අතර 10% බැගින් කපා හරිනු ලැබේ.

## ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය

## ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

### 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

| | හර | බැර |
|---|---|---|
| සමුච්චිත අරමුදල | | 5,735,681 |
| වාරික ආදායම | | 325,900 |
| පොලී ආදායම පෙර වර්ෂය | | |
| පොලී ආදායම | | 388,066 |
| ස්ථාවර තැන්පතු | 3,852,789 | |
| බැංකු ශේෂය | 2,404,255 | |
| ලැබිය යුතු පොලිය | 192,603 | |
| úයදï | | |
| | **6,449,647** | **6,449,647** |

## ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය

## ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| | 2013 | 2012 |
|---|---|---|
| ආදායම | | |
| වාරික ආදායම | 325,900 | 318,250 |
| පොලී ආදායම | 388,066 | 309,983 |
| එකතුව | 713,966 | 628,233 |
| úයදu | | |
| උත්සව අත්තිකාරම් | | 24,429 |
| එකතුව | - | 24,429 |
| අතිරික්තය | **713,966** | **603,805** |
| පෙර වර්ෂයේ ගැලපුම් | | |
| අතිරික්තය | **713,966** | **603,805** |

## ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
## 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

| වත්කම් | 2013 | 2012 |
|---|---|---|
| **<u>ස්ථාවර වත්කම්</u>** | | |
| **ස්ථාවර තැන්පතු** | 3,852,789 | 3,489,944 |
| **<u>ජංගම වත්කම්</u>** | | |
| **බැංකු ශේෂය** | 2,404,255 | 2,059,985 |
| **ලැබිය යුතු පොලී** | 192,603 | 185,752 |
| **මුළු වත්කම්** | **6,449,647** | **5,735,681** |
| **<u>වගකීම්</u>** | | |
| **සමුච්චිත අරමුදල** | 5,735,681 | 5,131,876 |
| **එකතුකලා - අතිරික්තය** | 713,966 | 603,805 |
| **මුළු වගකීම්** | **6,449,647** | **5,735,681** |

අධ්‍යක්ෂ/විදුහල්පති
ලං.ජ.කා.අ.ආයතනය

ගණකාධිකාරී
ලං.ජ.කා.අ.ආයතනය

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : එයිඑස්/ඩී/සීජීටීවීඅයි/1/13/07

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2015 ජුනි 19 දින

24 JUN 2015
General ...
C. G. 1. 7. 1

අධ්‍යක්ෂ/විදුහල්පති,

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය.

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පිටපත් :
1. ලේකම් - නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

(217)

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } වයිඑස්/ඩී/සීජීටීටීඅයි/1/13/07    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2015 ජුනි 12 දින

**අධ්‍යක්ෂ/විදුහල්පති,**

**ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය.**

**ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය සඳහා වූ විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ විදුහල්පතිවරයා වෙත 2015 ජනවාරි 26 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා.පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

1.5 ආයතනය සංස්ථාගත කිරීම.

------------------------------

2005 අගෝස්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/ 0994 / 029 / 013 ට අනුව ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය විධිමත් ලෙස සංස්ථාගත කරන තෙක් මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ අනන්‍යතාවය මත තවදුරටත් පවත්වාගෙන යාමට ඉඩදිය යුතු යැයි තීරණය කර තිබුණි. එම තීරණය ලබාදී වර්ෂ 10 ක් ඉක්ම ගොස් තිබියදීත් ආයතනය සංස්ථාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

02. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

215

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

---

ආයතනයේ සේවක කණ්ඩායම් 02 ක් සඳහා ක්‍රම 02 ක් යටතේ සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය හා පාරිතෝෂික දීමනා ගණනය කර තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන අතිරික්තය ලෙස රු. 532,074,670 ක් දක්වා තිබුණද විගණනයේදී කරන ලද ගණනය කිරීම් අනුව එම වටිනාකම රු. 514,586,175 ක් විය. ඒ අනුව රු. 17,488,495 ක් ප්‍රත්‍යාගණන අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ පත්වීම් ලැබ ආයතනයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව වෙන් කළ යුතු අර්ථසාධක අරමුදලෙහි වටිනාකම රු. 22,018,855 ක් වූ අතර ලෙජරයට අනුව ශේෂය රු. 23,435,838 ක් වී තිබුණි. ඒ අනුව මෙම ශේෂයන් දෙක අතර රු. 1,416,983 ක වෙනසක් නිරීක්ෂණය විය. සේවක අර්ථ සාධක අරමුදල් දායකය ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමෙන් උපයන ලද පොළිය ආදායමක් ලෙස හඳුනාගැනීම වෙනුවට අර්ථසාධක අරමුදල් ගිණුමට බැරකර තිබීම එම වෙනසට හේතු වී තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිදු කරන ලද ඉදිකිරීමකට අදාලව කෙරීගෙන යන වැඩ සම්බන්ධයෙන් සහතික කළ බිල්පත් ලැබීමට පෙර, වර්ෂ අවසානයේ මූල්‍ය වාර්තාවල රු. 1,894,765 ක ඇස්තමේන්තු වටිනාකමක් කෙරීගෙන යන ගොඩනැගිලි ලෙස සටහන් කර එහි බැර සටහන ණය හිමියන් ලෙස දක්වා තිබුණි. 2013 වර්ෂයේ සහතික කළ බිල්පත් ලැබීමෙන් පසු මුදල් ගෙවීමේදී උක්ත සටහන නොසලකා ගොඩනැගිලි ගිණුමට රු. 1,951,324 ක් හර කර මුදල් බැර කර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ලෙස ප්‍රත්‍යාගණන වටිනාකමක් ගිණුම්ගත කර තිබුණි. එහි අවසන් ප්‍රතිඵලය ලෙස ශේෂ පත්‍රයේ ණය හිමි ශේෂය රු. 1,894,765 කින් අධිගණනය වී තිබුණි.

(ඈ) බැංකු ජංගම ගිණුමක සමාලෝචිත වර්ෂය අවසාන දිනට මුදල් පොත අනුව ශේෂය රු. 19,133,425 ක් වූ අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය රු. 19,128,762 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල බැංකු ශේෂය රු. 4,663 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව ආයතනය පරිහරණය කරමින් පවතින වාහන 19 ක ශුද්ධ අගය රු. 439,961 ක් ලෙස සටහන්ව තිබුණු අතර එම වත්කම් ප්‍රත්‍යාගණනය කර නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

2005 වර්ෂයේ සිට පැවත එන රු. 1,133,529 ක ජංගම වත්කම් ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල පැවති අතර ඊට අදාල විස්තර විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2013 ජනවාරි 01 දිනට නොගෙවූ වේතන ශේෂය වූ රු. 308,496 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව යම් කටයුත්තක් සඳහා ලබාදෙන අත්තිකාරම් මුදල් එම කටයුත්ත නිම වූ වහාම පියවීමට කටයුතු කළ යුතු වුවත් භාණ්ඩ මිලදී ගැනීම සඳහා අවස්ථා 21 කදී ලබාදුන් එකතුව රු. 1,252,550 ක් වූ අත්තිකාරම්, භාණ්ඩ මිලදී ගෙන මාස 1-3 ත් අතර කාල ප්‍රමාදයකින් අත්තිකාරම් පියවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 31,919,207 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 9,811,037 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 22,108,170 ක පිරිහීමක් නිරීක්ෂණය විය. එම පිරිහීම කෙරෙහි ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් රු. 44,693,792 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---

4.1 කාර්යසාධනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළ පූර්ණකාලීන පාඨමාලා 09 ක් පවත්වා තිබුණු අතර වර්ෂය අවසන් වන විට පාඨමාලා 03 ක් සඳහා ප්‍රතීතණ (NVQ) සහතික ප්‍රදානය කර තිබුණි. ඉතිරි පාඨමාලා 04 ප්‍රතීතණය කිරීම සඳහා කටයුතු කරමින් පැවති අතර, මිල්රයිට් ශිල්පය හා ඩීසල් කාර්මික ශිල්පය යන පාඨමාලා සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් පුහුණු සම්මතයක් සකස් කර නොතිබුණි.

(ආ) වර්ෂ 04 ක පූර්ණකාලීන පාඨමාලා හදාරන සිසුන් සංඛ්‍යාව 1395 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 154,439,216 ක පිරිවැයක් දරා තිබුණි. ඒ අනුව එක් ශිෂ්‍යයකු වෙනුවෙන් වාර්ෂිකව රු. 110,709 ක් හා පාඨමාලාව නිමවන විට ශිෂ්‍යයෙකු වෙනුවෙන් එකතුව රු. 442,836 ක් වැය කිරීමට සිදුවී තිබුණි.

4.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය හා පුද්ගලික සමාගමක් අතර 2010 පෙබරවාරි 08 දින ඇතිකරගත් ගිවිසුමට අනුව රු. 1,103,200 ක පිරිවැයකට පරිගණක ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් සපයා සවි කිරීමට තිරණය කර තිබුණු අතර, 2010 හා 2011 වර්ෂවල ඒ සඳහා එකතුව රු. 591,100 ක පිරිවැයක් දරා තිබුණි. ගිවිසුමට අනුව පරිගණක ගිණුම්කරණ පද්ධතිය ස්ථාපිත කිරීම දින 90 ක් තුළ අවසන් කළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය නිමවන විටත් පැවති අඩුපාඩු හා දෝෂයන් හේතුවෙන් ගිණුම් සැකසීමට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් වැය කරන ලද මුදලට ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ආ) ආයතනය විසින් සිදුකරනු ලබන නිෂ්පාදන කටයුතු සම්බන්ධයෙන් පිරිවැය ගිණුම්කරන ක්‍රමය මත ගිණුම් තැබීම සිදුකර නොතිබුණි.

(ඇ) ආයතනයට පරිත්‍යාග ලෙස ලැබී ඇති භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කර හෝ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනය සතු වාහන වලට අදාල රක්ෂණ වටිනාකම්, රක්ෂණ දායක මුදල්,අනතුරු හා අලාභ හානි පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන හා ලිපිගොනු විධිමත් පරිදි නඩත්තු කර නොතිබුණි.

(ඉ) 2006 සහ 2007 වර්ෂවලට අදාලව තැන්පත් කර ඇති නමුත් උපලබ්ධි නොවූ වටිනාකම රු. 35,036 ක් වූ මුදල් ඇනවුම් 06 ක් විගණන දිනය වූ 2014 අගෝස්තු 08 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආධුනික ශිෂ්‍යයන්ට ලබාදෙන ශිෂ්‍යාධාර මුදලින් වාර්ෂිකව රු. 250 ක් අයකරමින් විධිමත් අනුමැතියක් නොමැතිව හා ප්‍රතිලාභ ගෙවීමට ක්‍රමවේදයක් නොමැතිව ආයතනය විසින් ආරම්භකරන ලද පුද්ගල අනතුරු හා රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අයත් ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශේෂය රු. 2,404,205 ක් වී තිබුණු අතර ඊට අදාල රු. 3,852,799 ක මුදලක් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළද ශිෂ්‍යාධාර මුදල් වලින් එකතුව රු. 325,900 ක් හා ආයෝජන පොලී ලෙස රු. 388,066 ක් රක්ෂණ අරමුදල වෙත ලැබී තිබුණි. මෙම යෝජනා ක්‍රමය සඳහා නීත්‍යානුකූල පදනමක් ඇති කර එයට දායක වූවන් සඳහා අනතුරුවලට අමතරව ප්‍රතිලාභයන් ලැබෙන පරිදි රක්ෂණ ක්‍රමය විධිමත් කිරීමට ආයතනය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ අර්ථසාධක අරමුදලෙහි දායකත්වය ලබා තිබූ ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයට අනුයුක්ත සේවකයන්ගේ වැටුපෙන් අය කරන ලද සේවක අර්ථ සාධක අරමුදල් දායකය හා එම අරමුදලින් සේවකයන්ට ලබාදෙන ලද ණය සඳහා අය කරන ලද වාරිකවල එකතුව වූ රු. 2,716,773 ක මුදල ශ්‍රී ලංකා මහ බැංකුවට යැවීමට හෝ ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිශ්චිත තීරණයක් නොමැතිව ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් ලෙස ගිණුම්ගත කර තිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් අනුමත පුහුණු පාඨමාලාවන් ක්‍රියාත්මක කිරීමට අමතරව අර්ධකාලීන, කෙටි කාලීන හා විශේෂ පුහුණු පාඨමාලාවන් පවත්වා තිබුණි. ඊට අදාලව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

I. මෙම පුහුණු පාඨමාලාවලට අදාල විෂය මාලා සැලසුම් කිරීම විෂය පිළිබඳ ප්‍රවීණතාවයක් ඇති විද්වත් මණ්ඩලයක් විසින් සිදුකර කාලීනව එම විෂයමාලාවන් සංශෝධනය කර නොතිබුණි. එමෙන්ම මෙම පාඨමාලා ආරම්භ කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

II. දේශක දීමනාවලට අමතරව මෙම පාඨමාලාවන් ක්‍රියාත්මක කරන නිලධාරීන් සඳහා විධිමත් අනුමැතියකින් තොරව වර්ෂය තුළ ප්‍රසාද දීමනා ලෙස රු. 179,000 ක් හා පැමිණීමේ දීමනාව ලෙස රු. 1,077,003 ක් ගෙවා තිබුණි. පාඨමාලාවලට අදාල පොදු කාර්යය හා අනෙකුත් පිරිවැය වෙන්කිරීමේ පදනම ද පැහැදිලි නොවුණු අතර ඒ සඳහා ද විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

III. විධිමත් අනුමැතියකින් තොරව මෙම පාඨමාලා ආදායමින් ස්ථාවර තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත්වල පිළිවෙලින් රු. 16,430,258 ක් හා රු. 7,056,642 ක් ආයෝජනය කර තිබුණි.

IV. සමාලෝචිත වර්ෂය අවසාන දිනට පාඨමාලා ආදායම රු. 41,673,397 ක් වූ අතර වියදම රු. 33,331, 522 ක් විය. පෙර වර්ෂය හා සැසඳීමේදී වියදම සියයට 60 කින් වැඩි වී තිබුණි. මෙම වියදමින් සියයට 87 ක් අර්ධකාලීන පාඨමාලා සඳහා නිලධාරීන්ට ගෙවන දීමනා වූ අතර මෙම දීමනා එක් එක් පාඨමාලා ආදායමෙන් සියයට 26 සිට සියයට 112 ක් දක්වා පරාසයක විහිදී පැවතුණි. මෙසේ දීමනා ගෙවීම සඳහා නිශ්චිත පදනමක් මෙන්ම විධිමත් අනුමැතියක් ලබාගත යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ආ) සේවක පාරිතෝෂික ගණනය කිරීමේ අවිධිමත් භාවය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

I. සේවක පාරිතෝෂික ගණනය කිරීමේදී පාරිතෝෂික දීමනා පනතට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර ඒ සඳහා ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ සභාපතිවරයාගේ ලිපිය පදනම් කර තිබුණි.

II. පාරිතෝෂික ගණනය කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයෙන් අනුයුක්ත කළ නිලධාරීන්ට හා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ නිලධාරීන්ට පදනම් දෙකක් අනුගමනය කර තිබුණි.

(ඈ) සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේ අවිධිමත් භාවය

සේවක අර්ථ සාධක අරමුදල් දායකය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

I. කම්කරු කොමසාරිස්ගේ 2005 මාර්තු 23 දිනැති අංක සේඅඅ / කම්කො / ලංජර්කාආ /05 ලිපිය පදනම් කර මධ්‍යම ගමනාගමන මණ්ඩලය යටතේ බඳවාගෙන ආයතනයට අනුයුක්ත කළ සේවකයන්ට, වැටුපෙන් සියයට 10 ක් හා ආයතනයෙන් සියයට 12 ක් ලෙස අර්ථසාධක අරමුදල් පනතෙහි 10(1) හා(2) වගන්තියට අනුකූල නොවන පරිදි අර්ථසාධක අරමුදලට දායකත්වය ලබාදී තිබුණි.

II. එම දායක මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවට ප්‍රේෂණය කිරීමෙන් තොරව ආයෝජනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට මුළු ආයෝජන වටිනාකම රු. 22,307,769 ක් වී තිබුණි.

4.5 නිෂ්කාර්යය වත්කම්

-----------------------

ආයතනයේ 25 වන සංවත්සරය සැමරීම සඳහා 1985 වර්ෂයේ නිකුත් කරන ලද ලොතරැයි ටිකට් අලෙවියෙන් ලද රු. 309,792 ක ආදායමක් අදාල අරමුණු කරා යොමු කිරීමෙන් තොරව ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර තිබුණි.

5. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදනය

(ආ) ගිණුම්කරණය

(ඇ) අභ්‍යන්තර පාලනය

(ඈ) සේවක ණය පාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩ බලන)

# ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

1.2 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

1.3 විගණකගේ වගකීම

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.5 ආයතනය සංස්ථාගත කිරීම

02. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

2.2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳව අදහස් දැක්වීම

2.2.1

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

අ) ඉඩම් හා ගොඩනැගිලි 2013 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන අවස්ථාවේදී අලුතින් ඉදි කරන ලද ගොඩනැගිලි 2 ක්ද ප්‍රත්‍යාගණනය කරන ලදි. එසේ නමුත් මෙම ගොඩනැගිලි 2 ට අදාල අවසන් බිල්පත් නොගෙවා තිබූ බැවින් අදාල ගොඩනැගිලි දෙක ප්‍රත්‍යාගණනය නොකල යුතු බව රජයේ විගණන අංශය පෙන්වා දෙන ලදි.

2014 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී ඉහත සඳහන් කල ගොඩනැගිලි දෙක පිරිවැයට සටහන් කිරීමටත් පෙර වර්ෂවලට අදාල ක්ෂය ගැලපීම නිසා වැඩියෙන් සඳහන් කර තිබූ ප්‍රත්‍යාගණනය අතිරික්තය නිවැරදි කිරීමටත් කටයුතු කරන ලදි.

ආ) ශ්‍රී.ලං.ග.ම. අර්ථ සාධක අරමුදල 2011 වසරේ නොවැම්බර් මස සිට අමාත්‍ය මණ්ඩල තීරණයකින් අවලංගු කර ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදලට පවරා ඇත. මෙම අවස්ථාවේ දී පැවති සේවක විරෝධතාවය හේතුවෙන් අර්ථ සාධක දායක මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදල වෙත යැවීම ප්‍රමාද විය.

එම කාල සීමාවේදී අර්ථ සාධක දායක මුදල් සහ සේවකයින් ශ්‍රී.ලං.ග.ම. අර්ථ සාධක අරමුදලෙන් ලබා ගෙන තිබූ නිවාස ණය වාරික අය කිරීම් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තැබීමට සිදු විය. ඒ සඳහා ලද පොළිය සේවකයන්ගේ අර්ථ සාධක දායක මුදල් ආයෝජනයෙන් ලැබූ ආදායමක් වූ බැවින් ආයතනයේ ආදායමක් ලෙස නොසලකන ලදි.

පසුව 2014 සැප්තැම්බර් මස දී හිඟ තිබූ අර්ථ සාධක දායක මුදල් සේවක අර්ථ සාධක අරමුදල වෙත යැවීමට කටයුතු කරන ලදි.

එසේ නමුත් ස්ථාවර තැන්පතු වලින් ලද පොලිය සේවක අර්ථ සාධක අරමුදල භාර නොගත් හෙයින් එම වටිනාකම තව දුරටත් ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර ඇත. මේ සම්බන්ධයෙන් ආයතනීය උපදේශක මණ්ඩලය හා විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී ද සාකච්ඡා කරන ලදි. මේ සම්බන්ධයෙන් හැකි ඉක්මනින් තීරණයක් ගෙන විසඳීමට කටයුතු කරන බව සඳහන් කරමි.

ඇ) 2014 වසර ගිණුම් පිළියෙල කිරීමේදී ඉදි කරන ලද ගොඩනැගිල්ලට අදාලව අවසාන බිල්පත ලැබීමට පෙර ඇස්තමේන්තු කර ගිණුම් ගත කර තිබූ රු. 1,894,765.00 ක වටිනාකම ගිණුම් වලින් ඉවත් කිරීමටත් ණය හිමියන්ගේ අගය නිවැරදි කිරීමටත් කටයුතු කරන ලදි. තව ද මෙම ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය කර තිබූ වටිනාකම ඉවත් කර පිරිවැයට ගිණුම් වල ඉදිරිපත් කිරීමටත් කටයුතු කරන ලදි.

ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ සඳහන් රු.19,128,762.00 ක වටිනාකම නිවැරදිය. මුදල් පොතේ ශේෂය රු.4,663.00 ක් අඩුවෙන් සඳහන් කර තිබීම නිවැරදි කරන ලදි.

ඉ) 2014 වර්ෂයේ දී වාහන වල වටිනාකම ප්‍රත්‍යාගණනය කර ප්‍රත්‍යාගණනය වටිනාකම රු. 36,568,000.00 ක් එම වර්ෂයේ ගිණුම් ප්‍රකාශ වල ඉදිරිපත් කිරීමට ද කටයුතු කර ඇති බව ප්‍රකාශ කරමි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම් ප්‍රකාශවල ජංගම වත්කම් යටතේ රු.1,133,529.00 ක වටිනා අගයක් ශ්‍රී.ලං.ග.ම. ජංගම ගිණුම නමින් ජංගම වත්කම් යටතේ සඳහන්ව ඇත. ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය යටතේ පැවති කාල සීමාවේදී ශ්‍රී.ලං.ග.ම. ප්‍රධාන කාර්යාලය හා අප ආයතනය අතර සිදුවූ ගණුදෙනු වලදී ලෙජරයේ ජංගම ගිණුමක සටහන් කරන ලදි. ඒ අනුව

රු. 1,133,529.00 ක අගයක් ශ්‍රී.ලං.ග.ම. ජංගම ගිණුම නමින් අපගේ මූල්‍ය ප්‍රකාශණවල සඳහන්ව ඇත.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් යටතේ දීර්ඝ කාලයක් සඳහන් වූ නොගෙවූ වේතන රු.365,211.00 ක ශේෂය අවලංගු කර ආයතනයේ ආදායමට ගැනීම සඳහා උපදේශක මණ්ඩල පත්‍රිකා අංක 21- 2016 යටතේ අනුමැතිය ලබා ගෙන ආදායමට ගැනීමට කටයුතු කර ඇත.

2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

අත්තිකාරම් චෙක්පත් ලබා දී නියමිත කාල සීමාවේ දී අදාල භාණ්ඩ ලබා ගැනීමට කටයුතු කර ඇති නමුත් එම භාණ්ඩ ලබා ගත් විගස අත්තිකාරම් වවුචරය පියවීමට කටයුතු කර නොමැත. සලකා බලන ලද කාල සීමාවේදී සම්පාදක අංශයේ හා ගබඩාවේ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටීම ද මෙම ප්‍රමාදයට හේතු විය. ප්‍රමාදයකින් තොරව නියමිත දින වලට අදාල ලේඛණ වල සටහන් කර පියවීම සිදු කල යුතු බවට සම්පාදක නිලධාරී හා ගබඩා නිලධාරී හට උපදෙස් ලබා දෙන ලදි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශන වල රු.31,919,207.00 ක හිඟයක් සඳහන් වුවද එය මූල්‍යමය වශයෙන් සිදුවූ පිරිහීමක් නොවන බව ප්‍රකාශ කරමි. ආයතනයේ ස්ථාවර වත්කම් ක්ෂය සඳහා වෙන් කිරීම සමාලෝචිත වර්ෂයේදී රු. 72,720,479.00 කි. එසේ නමුත් ඉකුත් වර්ෂයේදී ක්ෂය සඳහා වෙන් කිරීම රු. 36,514,662.00 කි. සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල රු.31,919,207.00 ක හිඟයක් පෙන්වීමට ද, එය ඉකුත් වර්ෂයට වඩා වැඩි වීමටද හේතුවී ඇත්තේ ක්ෂය සඳහා වෙන් කිරීම වැඩි අගයක් ගැනීම බව පෙන්වා දෙමි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

අ) වර්තමානයේදී පූර්ණ කාලීන පාඨමාලා 10 ක් පවත්වන අතර ඉන් 07 ක් ප්‍රතිතනය කර ඇත.ඉතිරි පාඨමාලා ප්‍රතිතනය කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින අතර හැකි ඉක්මනින් අදාල කාර්යය සම්පූර්ණ කරන බව සඳහන් කරමි.

ආ) ආයතනයේ කාර්ය මණ්ඩල වැටුප්, පුහුණු ද්‍රව්‍ය, ආධුනික දීමනා ගෙවීම, නඩත්තු වියදම් හා අනෙකුත් පුනරාවර්ථන වියදම් වෙනුවෙන් වර්ෂයකට රු.මිලියන 150.00 ක් පමණ වියදම් කිරීමට සිදුවේ. අප ආයතනයේ ශිෂ්‍යයෙකුගේ පුහුණු කාලය වර්ෂ 3-4 ක කාල සීමාවක් වන හෙයින් එක් ශිෂ්‍යයෙකු වෙනුවෙන් දැරීමට සිදුවන පිරිවැය ඉහලය. එසේ නමුත් මෙම ආයතනයෙන් පිටවයන පුහුණු ලාභීන් සඳහා දේශීය මෙන්ම විදේශීය රටවල රැකියා සඳහා ඉහල ඉල්ලුමක් හා පිළිගැනීමක් ඇත. එලෙසම ඔවුන්ට ක්ෂේත්‍රයේ ඉහල වැටුප් උපයා ගැනීමට හැකියාව ඇත.

එසේ හෙයින් වර්ෂයකට ශිෂ්‍යයෙකු වෙනුවෙන් දරණ වියදම අපතේ යාමක් නොවන බව සඳහන් කරමි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

අ) පරිගණක ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කලද එහි පැවති දෝෂ අඩුපාඩු නිසාද අප ආයතනයේ කාර්යය මණ්ඩලය සතුව මේ සම්බන්ධව පැවති දැනුම මදිකම නිසාත්, සැලසුම්කල පරිදි නියමිත කාල සීමාවේදී එම කාර්යය සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය. අදාල සැපයුම් ආයතනය සමඟද අවස්ථා කීපයකදී සාකච්ඡා පැවත්වීමට කටයුතු කර ඇත. මෙම පද්ධතිය සම්පූර්ණ වශයෙන් භාවිතා නොකලද එහි කොටස් භාවිතා කර අවශ්‍ය කාර්යයන් සිදු කරණ අතර, ඉතිරි අඩුපාඩු ද සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරණ මෙන් ගණකාධිකාරී වෙත උපදෙස් ලැබී ඇත.

මෙම පද්ධතිය සඳහා 60% ක් ගෙවා ඇති අතර ඉතිරි මුදල් ගෙවා නොමැති බවද සඳහන් කරමි.

ආ) ආයතනය මගින් සිදුකරන නිෂ්පාදන කාර්යයන් හිද එකිනෙක කාර්ය වෙනුවෙන් කාර්ය පත්‍රිකාවක් පිලියෙල කර එහි පිරිවැය ගණනය කිරීම සිදු කරනු ලබන බව සඳහන් කරමි.

ඇ) 2014 වර්ෂයේ දී ආයතනයට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වාහන පොත්වල වටිනාකම ගණනය කර එම වර්ෂයේ ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී එම වටිනාකම් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව ප්‍රකාශ කරමි.

ඇ) ආයතනය සතු වාහන සම්බන්ධයෙන් නඩත්තු කල යුතු ලේඛණ නිසි පරිදි නඩත්තු කරන ලෙසට එම අවශ්‍යභාර නිලධාරියාට උපදෙස් ලබා දී ඇති අතර වර්තමානයේදී එම ලේඛණ නියමිත පරිදි පවත්වාගෙන යන බව සඳහන් කරමි.

ඉ) උපලබ්ධි නොවූ මුදල් ඇණවුම් තවදුරටත් උපලබ්ධි නොවන බැවින් ඒවා පොත් වලින් කපා හැරීම සඳහා ආයතනීය උපදේශක මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත. එලෙසම ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අදාල කාර්යය නිරවුල් කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරමි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

අ) ආධුනික රක්ෂණ අරමුදල පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන ඇත.එලෙසම අදාල අරමුදල ආයතනීය පනතට ඇතුලත් කිරීමටද අවශ්‍ය පියවර ගෙන ඇති බව ප්‍රකාශ කරමි.

ආධුනික පුද්ගල අනතුරු ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ඇති කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ ආධුනිකයින් හට අනතුරක් සිදුවූ අවස්ථාවකදී ඒ සඳහා වන්දි මුදලක් ලබා දීමයි. අප සෑම අවස්ථාවකදීම ආධුනිකයින්ගේ ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන අතර සෑම විටම ආධුනිකයින්ට ඔවුන්ගේ ආරක්ෂාව කෙරෙහි සැලකිලිමත්වන ලෙස අවවාද හා උපදෙස් ලබා දෙනු ලැබේ.

එසේ හෙයින් අප ආයතනය තුල ආධුනිකයින් 1500 ක් පමණ පුහුණුව ලැබුවද වර්ෂයකට සිදුවන අනතුරු ප්‍රමාණය සීමිතය. යම් අවස්ථාවකදී අනතුරක් සිදු වුවද එය වන්දි මුදලක් ලබා දීමට තරම් බරපතල නොවනු ඇත. එසේ නමුත් අනතුරක් සිදු නොවන බව නිශ්චිතවම සඳහන් කල නොහැක. එබැවින් මෙම ආධුනික රක්ෂණ හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පවත්වාගෙන යාම අවශ්‍ය වනු ඇත.

මෙම යෝජනා ක්‍රමය සඳහා නව සාමාජික කමිටුවක් පත්කරගෙන ඇත. එලෙසම මෙම යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීමට හා ආධුනිකයින්ට වැඩි ප්‍රතිලාභයක් ලබා ගත හැකි පරිදි යෝජනා ඉදිරිපත් කරන ලෙසටද උපදෙස් ලබාදී ඇත.

ආ) පෙන්වා දී ඇති වටිනාකම ශ්‍රී.ලං.ග.ම. පෞද්ගලික අර්ථ සාධක අරමුදලෙන් ලබා ගත් නිවාස ණය වාරික අය කිරීමය. ශ්‍රී.ලං.ග.ම. පෞද්ගලික අර්ථ සාධක අරමුදල අවලංගු කර ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදල වෙත පැවරීමෙන් පසු එම අරමුදලින් ලබා තිබූ නිවාස ණය වාරික අයකර ගැනීම් ආපසු ගෙවීමට හැකියාව නැති විය.

ආරම්භයේදී සේවකයින් 18 දෙනෙකුගෙන් අයකර ගත් වාරික පැවති නමුත් පසුව සේවකයින් 14 දෙනෙකු හට මුදල් ආපසු ලබා ගන්නා ලදි. තව දුරටත් මෙම ණය වාරික අයවීම් ආපසු ලබා නොගත් සේවක මහතුන් 04 දෙනෙකුගේ මුදල් ආයතනය සතුව ඇති අතර ඔවුන් තම මුදල් ආපසු ලබා ගැනීමට අකමැත්ත ප්‍රකාශ කර ඇත.

මේ සම්බන්ධව කම්කරු කොමසාරිස්තුමා සේවක අර්ථ සාධක අරමුදල හා ශ්‍රී.ලං.ග.ම. සමඟ සාකච්ඡා පවත්වා ඇති අතර එකඟතාවයකට එළඹී වහාම එම සේවකයින් 04 දෙනාගේ අය වී ඇති වාරික මුදලද නිරවුල් කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරමි.

4.4 මත භේදයට තුඩු දෙන ගනුදෙනු

අ.(i) කෙටි කාලීන මෝටර් කාර්මික පාඨමාලා NVQ 3 මට්ටමට ගෙන ඒමට ප්‍රධාන ඉංජිනේරු මෝටර් කාර්මිකගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇත.

මෙම පාඨමාලා ආරම්භකර ඇත්තේ 1979 වර්ෂයේදීය.එනම් මෙම ආයතනය ශ්‍රී.ලං.ග.ම යටතේ පැවති කාල සීමාවේදීය.

(ii) ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලය යටතේ පැවති ආයතනයකි.ශ්‍රී.ලං.ග.ම යටතේ පත්වීම්ලාභී සේවකයින් වැඩි පිරිසක් මෙම ආයතනයේ සේවය කරයි. ශ්‍රී.ලං.ග.ම විසින් වාර්ෂිකව ප්‍රසාද දීමනා ගෙවීමේදී මෙම ආයතනයේ සේවකයින් සඳහාද ප්‍රසාද දීමනා හිමි විය.

පසුව මෙම ආයතනය ශ්‍රී.ලං.ග.ම වෙතින් ඉවත්ව 2004 වර්ෂයේදී නිපුණතා සංවර්ධන හා කාර්මික පුහුණු අමාත්‍යාංශය යටතට පත් විය.

අමාත්‍යාංශය යටතට පත් වූ පසුවද සේවකයින් එතෙක් ලැබූ ප්‍රසාද දීමනාව අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන ගෙවීමට කටයුතු කරන ලදි. ඒ අනුව 2013 වර්ෂයේදී එක සේවකයෙකු සඳහා රු.1000.00 ක මුදලක් ගෙවා ඇත. ප්‍රසාද මුදල් ගෙවීම සඳහා ආයතනයේ ඉපයුම් ආදායම භාවිතා කර ඇති බව සඳහන් කරමි.

මොටර් කාර්මික ක්ෂේත්‍රයට අදාල කෙටි කාලීන පාඨමාලාවන් NVQ 3 මට්ටමට ගෙන එම සඳහා අධ්‍යක්ෂ/ විදුහල්පති විසින් ප්‍රධාන ඉංජිනේරු (මොටර් කාර්මික ) සමන්විත අංශ ප්‍රධානීන් ඇතුලත් කමිටුවක් පත්කර ඇත.

අප ආයතනය මුදල් අයකර සන්ධ්‍යා කාල කෙටිකාලීන පාඨමාලා පවත්වන අතර එහි ඉගැන්වීම සඳහා ආයතනයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරින් සහභාගිවේ.ඒ සඳහා ඔවුන්ට සේවය කරන කාල සීමාව සඳහා දිමනාවක් ගෙවනු ලැබේ. එම නිලධාරින්ගේ පැමිණීම දිරිමත් කිරීම පිණිස මාසිකව පැමිණීමේ දිමනාවෙක් ගෙවන අතර මාසිකව නොපැමිණීමේ දින ගණන අනුව අදාල දීමනාව අඩුකරනු ලැබේ. මෙම දිමනාවද පාඨමාලාව සඳහා අයකරන ආදායමින් ගෙවිමට කටයුතු කර ඇති අතර ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.කෙටිකාලීන පාඨමාලා සඳහා අදායම් වියදම් වාර්තා සැකසීමේදි ඊට අදාල සෘජු වියදම් වලට අමතරව පොදු කාර්යය වියදම් ලෙස ආයතනයේ ජලය,විදුලිය හා නඩත්තු වියදමින් 1/3 ක් අදාල කරගනු ලැබේ.

(III) ස්ථාවර තැන්පත් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා මගින් 2013.08.07 දින භාණ්ඩාගාරයට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති නමුත් ඒ සඳහා පිළිතුරක් ලැබී නැත.පසුව

මෙම ආයෝජන අවලංගු කර ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදි.මේ සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමා මගින් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා 2015.02.13 දින රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇත.

තවද මේ සම්බන්ධව රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව වර්තමානයේදී මෙම ආයතනයට සම්මත වූ පනතක් නොමැති බැවින් ආයතනයේ පනත සම්මත වූ පසුව ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමු කල හැකි බව ප්‍රකාශ කරන ලදි.

(iv) සමාලෝචිත වර්ෂයේදී ආදායම පෙර වර්ෂය හා සැසදීමේදී 53%කින් ඉහල ගොස් ඇත.ඊට සාපේක්ෂව වියදමද ඉහල ගොස් ඇති අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 60% ක අගයක් ගනී. ආයතනයේ ඇති සෑම ක්ෂේත්‍රයකම පාඨමාලාවන්ට අදාලව කෙටි කාලීන පාඨමාලාවන් ද සැලසුම් කර ඇති අතර සමහර පාඨමාලා සඳහා වැඩි ඉල්ලුමක් පවතින අතර සමහර පාඨමාලා සඳහා ඉල්ලුම අඩුවේ. පාඨමාලා කාලය පැය 75 ක් හෝ පැය 150ක් වන පරිදි එම පාඨමාලා සැලසුම් කර ඇති අතර සහභාගිවන උපදේශක මහතෙකු සඳහා පැයකට රු. 360.00 ක පමණ මුදලක් ගෙවා ඇත.

බල විදුලි, වායු සමීකරණ, ප්‍රාථමික පුහුණු, මෝටර් කාර්මික පාඨමාලා සඳහා සහභාගිවන ආධුනිකයින් සංඛ්‍යාව වැඩි හෙයින් එම පාඨමාලාවලින් ලැබෙන ආදායම වැඩිය. එසේ නමුත් යන්ත්‍රණ,වෙල්ඩිං පාඨමාලා සඳහා සහභාගි වන ආධුනිකයින් සංඛ්‍යාව අඩු බැවින් එම සෑම පාඨමාලාවක් සඳහාම උපදේශක වරුන් සහභාගි කල යුතු බැවින් ආදායම අඩු පාඨමාලාවල උපදේශකවරුන් සඳහා ගෙවනු දීමනාව වැඩි ප්‍රතිශතයක් පෙන්නුම් කරයි.

ආ) සේවක පාරිතෝෂික ගණනය කිරීමේ අවිධිමත් භාවය

(i) ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලය 1990 දෙසැම්බර් මස 28 දින ජනතාකරණය කරන අවස්ථාවේදී සේවයේ නිරතව සිට වන්දි නොලබා සේවය අවසන් කරනු ලබන සේවකයින්ට සේවය කරන වසරක් සඳහා මසක පාරිතෝෂික දීමනාවක් ගෙවන ලෙස 1994 ශ්‍රී.ලං.ග.ම. පාලක මණ්ඩල පත්‍රිකා අංක 21 මගින් සහ 1996 ශ්‍රී.ලං.ග.ම. පාලක මණ්ඩල පත්‍රිකා අංක 02 මගින් අනුමැතිය ලබා ගෙන ඇත.

ශ්‍රී.ලං.ග.ම. පත්වීම්ලාභී මසක පාරිතෝෂික දීමනාවක් සඳහා හිමිකම් ලබන ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ සේවය කරන සේවක මහත්ම මහත්මීන්ටද ඒ අනුව මසක පාරිතෝෂික දීමනාවක් ගෙවනු ලැබේ.

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ සේවය කරනු ලබන සේවකයින්ට තව දුරටත් මෙම පාරිතෝෂික හිමිකම ලබා දෙන ලෙස ගරු යෞවන කටයුතු අමාත්‍ය තුමා හා ප්‍රවාහන අමාත්‍ය තුමා සමඟ 2010.10.12 දින අත්සන් කර ඇති අවබෝදතා ගිවිසුම 1.1 පරිච්ඡේදයේ සඳහන් කර ඇත.

මසක පාරිතෝෂික දීමනා හිමිවන සේවකයින් කවුද යන්න ශ්‍රී.ලං.ග.ම. සාමාන්‍යාධිකාරී විසින් 1995 මාර්තු 14 දින ලබා දී ඇති PA 642 දරණ ලිපියේ පැහැදිලිව සඳහන් කර ඇත. එලෙසම 1996 අංක 02 දරණ ශ්‍රී.ලං.ග.ම. පාලක මණ්ඩල පත්‍රිකාව තුලින් තව දුරටත් මේ සඳහා හිමිකම් ලබන සේවකයින් කවුරුද යන්න පැහැදිලි කර ඇත.

(II) ආයතනයේ පාරිතෝෂික ගණනය කිරීම ශ්‍රී.ලං.ග.ම. පත්වීම්ලාභී සේවකයින්ට ද ලං.ජ.කා.අ.ආ. පත්වීම්ලාභී සේවකයින්ට ද 1983 අංක 12 දරණ පාර්තෝෂික පනතට අනුව සේවය කර ඇති වසරකට සති 02 ක් වන පරිදි ගණනය කරනු ලැබේ.

එසේ නමුත් 1990.12.28 දිනට සේවයේ නිරතව සිටි ශ්‍රී.ලං.ග.ම. පත්වීම්ලාභී සේවකයින් සඳහා පෙර පැහැදිලි කල පරිදි මසක පාරිතෝෂික දීමනාවක් ගණනය කරනු ලැබේ.

ඇ) සේවක අර්ථ සාධක අරමුදල් දායකය ගණනය කිරීමේ අවිධිමත් භාවය

I.) ලං.ජ.කා.අ.ආයතනයෙන් පත්වීම්ලාභී සේවකයින් සඳහා අර්ථ සාධක අරමුදල් පනතෙහි 10(1) හා (2) වගන්තියට අනුකූල වන පරිදි වැටුපෙන් 8% ක් හා ආයතනයෙන් 12% ක් වන පරිදි අර්ථ සාධක දායක මුදල් ගණනය කරනු ලැබේ.

ශ්‍රී.ලං.ග.ම. පෞද්ගලික අර්ථ සාධක අරමුදල සඳහා දායක මුදල් ගණනය කිරීම සිදුවූයේ වැටුපෙන් 10% ක් හා ආයතනයෙන් 12% ක් වන පරිදිය.

එම අර්ථ සාධක අරමුදල සඳහා දායකත්වය හිමි වූ ශ්‍රී.ලං.ග.ම. පත්වීම්ලාභී සේවකයින් සඳහා අර්ථ සාධක අරමුදල් ගණනය කිරීම වර්තමානයේදී ද වැටුපෙන් 10% ක් හා ආයතනයෙන් 12% ක් වන පරිදි සිදු කරයි.

II) ශ්‍රී.ලං.ග.ම. පෞද්ගලික අර්ථ සාධක අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදල වෙත පැවරීමෙන් පසු ඇතිවූ සේවක විරෝධතාවය නිසා මුල්කාල සීමාවේදී අර්ථ සාධක දායක මුදල් යැවීමට නොහැකි විය. නමුත් සියලු හිඟ මුදල් සමඟ අර්ථ සාධක දායක මුදල් 2014 සැප්තැම්බර් මසදී සේවක අර්ථ සාධක අරමුදල වෙත යවන ලදි.ඉන් පසු අඛන්ඩව නියමිත දිනට අර්ථ සාධක දායක මුදල් ගෙවන බව සඳහන් කරමි.

## 4.5 නිෂ්කාර්ය වත්කම්

ආයතනයේ 25 වන සංවත්සර උත්සවයේ ටිකට්පත් අලෙවියෙන් ලද ආදායම මෙලෙස ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර තිබුණි. පසුව ආයතනයේ උපදේශක මණ්ඩල අනුමැතිය ලබා ගෙන ආයෝජනය කර තිබූ මුදල් ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කරන ලදි.

## 5. පද්ධති පාලනයන්

පෙන්වා දී ඇති අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කර පිළිවෙත් අනුව කටයුතු කරන ලෙසට ඒ සම්බන්ධව කටයුතු කරන නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව ප්‍රකාශ කරමි.

අධ්‍යක්ෂ/ විදුහල්පති
ලං.ජ.කා.අ.ආයතනය